GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2026.01.30

මාධ්‍ය නිවේදනය

නිදහස් සෞඛ්‍ය සේවයේ මුහුණ දී ඇති ගැටලු විසඳා ගැනීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ සියලු සෞඛ්‍ය වෘත්තීය සමිති අතර හමුවක්.

ශ්‍රී ලාංකීය නිදහස් සෞඛ්‍ය සේවාව ඉහළ ගුණාත්මකභාවයකින් යුතුව පවත්වා ගැනීමෙහිලා ප්‍රමුඛතම සහ තීරණාත්මකම කාර්යභාරය සිදු කරනුයේ වෛද්‍යවරුන් ප්‍රමුඛ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයයි.

මේ වන විට රෝගී සත්කාර සේවාවන් සැපයීමේදී සියලු ශ්‍රේණි සහ කාණ්ඩ වල සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට විවිධ අපහසුතා, දුෂ්කරතා සහ අභියෝග ගණනාවකට මුහුණ දීමට සිදු වී ඇත. එවන් අභියෝගාත්මක පරිසරයක් තුල වුවද තම රාජකාරිය නොපිරිහෙලා ඉටු කරන සමස්ථ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ගැටලු විසඳිමෙහිලා රජයේ සහ වගකිවයුත්තන්ගේ අවදානය හෝ ප්‍රමුඛතාව නොලැබීම අවාසනාවන්ත තත්ත්වයකි.

නිදහස් සෞඛ්‍ය පද්ධතිය මුහුණ දී ඇති ගැටලු මෙන්ම වෛද්‍යවරුන් ඇතුලු සමස්ථ වෛද්‍ය සේවකයින් මුහුණු පා ඇති දුෂ්කරතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීමත්, ඒවාට විසඳුම් හඳුනාගැනීමත් අරමුණු කරගනිමින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ විධායක සභාව සහ සියලු සෞඛ්‍ය වෘත්තීය සමිති අතර සාකච්ඡාවක් 2026.01.29 වැනි දිනයේදී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි.

මෙම සාකච්ඡාව සඳහා වෛද්‍ය, දන්ත වෛද්‍ය, හෙද, අතුරු වෛද්‍ය, පරිපූරක වෛද්‍ය ඇතුලු සෞඛ්‍ය සේවයේ සියලු ශ්‍රේණින් නියෝජනය කරන වෘත්තිය සමිති ගණනාවක නියෝජිතයින් සහභාගි විය.

සෞඛ්‍ය සේවාව සහ සෞඛ්‍ය සේවකයින් මුහුණ දී ඇති පොදු ගැටලු වලදී ශ්‍රේණි අතර බෙදීමකින් තොරව එකම කණ්ඩායමක් ලෙස එක්ව ශක්තිමත්ව කටයුතු කිරීමට මෙහිදී එකඟ විය.

ඒ අනුව,

- සෞඛ්‍ය සේවයේ අනුමත සෞඛ්‍ය කාර්යමණ්ඩලයේ සංඛ්‍යාව යාවත්කාලීන කිරීම
- ඖෂධ සහ උපකරණ හිඟය
- ඖෂධ සහ උපකරණ වල ප්‍රමිතිය පිළිබඳ ගැටලු
- රෝහල් පද්ධතිය තුල සෞඛ්‍ය කාර්යමණ්ඩලයේ ආරක්ෂාව
- රෝගී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රඥප්තියට සමාන්තරව සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ආරක්ෂා කිරීමේ ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීම
- යෝජිත ප්‍රාථමික සෞඛ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ

ආදි කරුණු වලදී මෙම වෘත්තීය සමිති සියල්ල පොදු එකමුතුවක් සහ පුළුල් සංවිධානයක් ලෙස කටයුතු කිරීමට නියමිතය.

එමෙන්ම එක් එක් සේවා කාණ්ඩයන්ට අනන්‍ය වූ ගැටලු වලදී වෙන් වෙන්ව එම ගැටලු වෙනුවෙන් පෙනී සිටීමට සහ වෙන වෙනම වෘත්තිය සටන් කිරීමට එකඟ විය.

ඒ අනුව ශ්‍රී ලාංකීය නිදහස් සෞඛ්‍ය සේවාව සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය රැක ගනිමින් රෝගී ජනතාවගේ ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත කිරීම උදෙසා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ප්‍රමුඛ සියලු සෞඛ්‍ය වෘත්තීය සමිති පොදු එකමුතුවක් ලෙස ඉදිරියට කටයුතු කිරීමට සුදානම් බව අවධාරණය කරමු.

ස්තූතියි.
මීට විශ්වාසී,



වෛද්‍ය ප්‍රභාත් සුගතදාස,
ලේකම් .

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

වෛද්‍ය චමිල් විජේසිංහ(මාධ්‍ය ප්‍රකාශක)	-	0717080041
වෛද්‍ය පාලිත රාජපක්ෂ	-	0718480300
වෛද්‍ය හංසමාල් වීරසුරිය	-	0776549339
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ	-	0777829001
වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ	-	0716812160
වෛද්‍ය ආර්. තනිගවාසන්	-	0772369608
වෛද්‍ය අජන්ත රාජකරුණා	-	0766736296
වෛද්‍ය චාරුනි කොහොඹන්ගේ	-	0714410467
වෛද්‍ය අන්ෆාස් ෆාරූක්	-	0771115117
වෛද්‍ය සංජීව තල්ගහගොඩ	-	0716173330